# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2193/12 - 2020 සැප්තැම්බර් මස 16 වැනි බදාදා - 2020.09.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු ආඥාපනත යටතේ නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2020

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2020 සැප්තැම්බර් මස 10 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**එස්. ආර්. ආටිගල,**
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**යෝජනාව**

මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවද මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

1A - G 32986 — 55 (2020/09)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| ශීර්ෂ අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | | විස්තරය | තීරුබදු ප්‍රමාණය වරණීය | තීරුබදු ප්‍රමාණය සාමාන්‍ය | ප්‍රමාණ ඒකකය |
|---|---|---|---|---|---|---|
| (1) | (2) | | (3) | (4) | (5) | (6) |
| **27.10** | | | **අශුද්ධ තත්ත්වයේ හැර, පැට්‍රෝලියම් තෙල් වර්ග සහ ගල්කීලමය ඛනිජ වර්ගයන්ගෙන් ලබාගත් තෙල් වර්ග ; බරෙන් 70% කට නොඅඩුව පැට්‍රෝලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු, මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග ; වේස්ට් ඔයිල්** | | | |
| | | | | | | |
| | | - | **තෙල් වර්ග, බරෙන් 70% කට නොඅඩුව පැට්‍රෝලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග (භාවිතයෙන් පසු ඉවතලන ලද තෙල් (වේස්ට් ඔයිල්) හැර ජෛව ඩීසල් අඩංගු) :** | | | |
| | | ---- | පැට්‍රෝල් | | | |
| | 2710.12.21 | ---- | ඔක්ටේන් අංක 92 සහිත පැට්‍රෝල් | | ලීටරයකට රු. 50 | කි. ග්‍රෑ. |
| | 2710.12.22 | ---- | ඔක්ටේන් අංක 95 සහිත පැට්‍රෝල් | | ලීටරයට රු. 50 | කි. ග්‍රෑ. |
| | 2710.12.29 | ---- | අනෙකුත් | | ලීටරයට රු. 50 | කි. ග්‍රෑ. |
| | | --- | ගෑස් ඔයිල්/ඩීසල් | | | |
| | 2710.19.41 | ---- | කිලෝග්‍රෑම් 1කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට නොවැඩි ගෙන්දගම් අඩංගු සුපිරි ඩීසල් | | ලීටරයට රු. 25 | කි. ග්‍රෑ. |
| | 2710.19.42 | ---- | කිලෝග්‍රෑම් 1කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට වැඩි නමුත් කිලෝග්‍රෑම් 1කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 500ට නොවැඩි ගෙන්දගම් අඩංගු අනෙකුත් ඩීසල් වර්ග | | ලීටරයට රු. 25 | කි. ග්‍රෑ. |
| | 2710.19.49 | ---- | අනෙකුත් | | ලීටයරට රු. 25 | කි. ග්‍රෑම් |

10 - 354

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.